**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවචනය කළ මතය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ (“සංස්ථාව”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාවචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1හි 32 ඡේදය අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මඟින් අවසර දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවද ඉදිකිරීම් ණයගැතියන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙලින් රු. මිලියන 31.86 ක් සහ රු.මිලියන 0.52 ක් වූ වත්කම් වගකීම් ශේෂයන් එකිනෙකට හිලව් කර තිබුණි. | ඉදිරියේ දී සිදු නොවීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි ගැලපීම් කර විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ)මූල්‍ය වාර්තාකරණය සඳහාවන සංකල්පනාත්මක රාමුවෙහි ඡේද අංක 4.8 සිට 4.14 ට පටහැනිව භෞතිකව පවතින තොග ශේෂය සහ ගිණුම්කරණ පද්ධතිය තුළ දක්වා ඇති තොග වටිනාකම අතර වෙනස වූ රු. මිලියන 58.25 ක ශේෂයක් තොග ගැලපුම් ගිණුමක ඇතුළත් කර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය තුළ ඇතුළත් වී තිබීම හේතුවෙන් සංස්ථාවේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | රු. මිලියන 58.25 ක් වූ තොග ගැලපුම් ශේෂයට හේතුවූ කරුණු සොයාබලා ගිණුම්වලට අවශ්‍ය ගැලපිලි සිදු කරනු ලබයි. දැනටමත් සැලකිය යුතු අගයකින් නිවැරදි කිරීම් සිදුකර ඉහත ශේෂය අඩු කර ඇති අතර ඉතිරි ශේෂය ද නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරියේ දී හඳුනාගත් වෙනස්කම් ගැලපුම් කර නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ ණයහිමියෙකු වූ 2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලික සමාගමකින් ලැබිය යුතු ශේෂයක් ලෙස | 2025 වර්ෂයේදී අවශ්‍ය වෙන් කිරීම් මූල්‍ය ප්‍රකාශනවලට සිදු කරනු ඇත. | වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ ආයතනයකට වැට් |

| | |
|---|---|
| රු.මිලියන 27.81 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, සංස්ථාව අදාළ සමාගමෙන් සේවාවන් ලබාගෙන වැට් බදු සහිතව ගෙවීම් කර තිබුණ ද එම සමාගම වැට් බදු ලියාපදිංචි ආයතනයක් නොවූ බැවින් වැට් බදු හිලව් කර ගත නොහැකි විය. 2020 වර්ෂයේ සිට අදාළ මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | සහිතව ගෙවීම් කිරීම තුළින් අයකර ගත නොහැකි වූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු .මිලියන | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු .මිලියන | වෙනස රු .මිලියන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | වෙළඳ ණයහිමි හා විවිධ ණයහිමි | 1,156.07 | 1,155.30 | 0.77 | ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන සංසන්දනය කර නිවැරදිව සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | 1,700.28 | 1,695.06 | 05.22 | ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |
| (ඇ) | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් | 488.38 | 389.36 | 99.02 | ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |
| (ඈ) | කොන්ක්‍රීට් අංගන ණයැතියෝ | 63.84 | 42.57 | 21.27 | ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |
| (ඉ) | මිල දී ගැනීමේ අත්තිකාරම් | 30.63 | 30.86 | (0.22) | ඉදිරියේ දී නිවැරදි කිරීම් | -එම- |

සිදු කිරීමට කටයුතු කරනු ඇත.

### 1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අලාභය රු.මිලියන 1,411.00 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු.මිලියන 6,812.52 ක් විය. එසේම වත්කම් ඉක්ම වූ බැරකම්වල වටිනාකම රු.මිලියන 4,562.51 ක් වූ අතර ජංගම වත්කම් ඉක්ම වූ ජංගම බැරකම් ප්‍රමාණය රු.මිලියන 4,161.91 ක් විය. තවද 2024 සැප්තැම්බර් 10 දිනැති අංක අමප/24/1684/608/032-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම සංස්ථාවේ අංශ 03 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ඒකාබද්ධ කිරීමට තීරණය කර තිබුණ ද මේ දක්වා සංස්ථාව විසින් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. ඒ අනුව අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාවයක් විගණනයේදී නිරීක්ෂණය වුව ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 01 හි 25 ඡේදයට පටහැනිව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොමැති බව සටහන් අංක 2.1.2 මඟින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. | 2024 සැප්තැම්බර් 10 දිනැති අංක අමප/24/1684/608/032-I දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සංස්ථාව මාර්ග සංවර්ධන අධිකාරියට ඒකාබද්ධ කිරීමට තීරණය කළ නමුදු සංස්ථාව වසා දැමීම නිසා සිදුවන ප්‍රතිවිපාක සලකා බැලීමෙන් අනතුරුව 2025 සැප්තැම්බර් 10 දින අග්‍රාමාත්‍යතුමිය සමඟින් පැවති සාකච්ඡාවේදී සංස්ථාව ඈවර කිරීම හෝ පවත්වාගෙන යාම යන අවස්ථා දෙක සඳහාම පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් කර තීරණයක් ගත යුතු බව නිගමනය කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව කටයුතු කළ යුතු අතර ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිවැරදිව තක්සේරු කර අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු .මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඈවර කිරීමට නියමිත පරිපාලිත සමාගමක්වන ඩෙව්කොෂෝවා (පුද්ගලික) සමාගමෙහි ආයෝජනය | 9.21 | ශේෂ තහවුරු කිරීම් හා විගණන සාක්ෂි | ගිණුම්වල සඳහන් ආයෝජන මෙන්ම ණයගැතියන් සඳහා ද ප්‍රමාණවත් විස්තර නොමැති නිසා, ආරක්ෂක ක්‍රමවේදයකට අනුව අඩමාන ණය සඳහා වෙන්කිරීම සියයට සියයක් සිදු කර ඇත. | ආයෝජනවල පැවැත්ම හා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට අදාළ තොරතුරු හා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ඩෙච්කොෂෝවා (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු ණයගැති ශේෂය | 25.31 | ශේෂ තහවුරු කිරීම් හා විගණන සාක්ෂි | ගිණුම්වල සඳහන් ආයෝජන මෙන්ම ණයගැතියන් සඳහා ද ප්‍රමාණවත් විස්තර නොමැති නිසා, ආරක්ෂක ක්‍රමවේදයකට අනුව අඩමාන ණය සඳහා වෙන්කිරීම සියයට සියයක් සිදු කර ඇත. | ණයගැති ශේෂයන්හී නිවැරදිතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා කිරීමට විස්තරාත්මක ලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ඉදිකිරීම් ණයගැතියෝ | 93.79 | ශේෂ තහවුරු කිරීම් | ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති නමුත්, මේවන තෙක් තහවුරු කිරීම් ලැබී නොමැත. | ණයගැති ශේෂවල පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ඉදිකිරීම් රඳවා ගැනීම් | 574.13 | ශේෂ තහවුරු කිරීම් | ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති නමුත්, මේවන තෙක් තහවුරු කිරීම් ලැබී නොමැත. | රඳවා ගැනීම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ණයගැතියෝ (මාර්ග සංඥා) | 95.77 | ශේෂ තහවුරු කිරීම් | ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති නමුත්, මේවන තෙක් තහවුරු කිරීම් ලැබී නොමැත. | ණයගැති ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | ණයගැතියෝ (කොන්ක්‍රීට් අංගන), | 63.84 | ශේෂ තහවුරු කිරීම් | ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති නමුත්, මේවන | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | තෙක් තහවුරු කිරීම් ලැබී නොමැත. | |
| (උ) | ලූජිමා ස්ටේට් කෝපරේෂන් (පරිපාලිත සමාගම) වෙත සිදු කරන ලද මිල දී ගැනීම් අත්තිකාරම් | 2.17 | ශේෂ තහවුරු කිරීම් | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. ශේෂ තහවුරු කිරීම් ගෙන නොමැත. | මිල දී ගැනීම් අත්තිකාරම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඌ) | ඉන්ධන තැන්පතු | 15.31 | ශේෂ තහවුරු කිරීම් | ඉන්ධන තැන්පතු රු.මිලියන 15.31 සඳහාවන උපලේඛණය මේ සමග අමුණා ඇත. | ඉන්ධන තැන්පතු ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගැනීම් ශේෂය රු.මිලියන 574.13 ක් වූ අතර එයින් රු.මිලියන 275.95 ක් අවුරුදු 5කට වැඩි කාලයක් නිරවුල් කර ගැනීමකින් තොරව පැවතුණි. ජංගම වත්කම් යටතේ පෙන්වනු ලබන රඳවා ගැනීම් ශේෂයෙන් රු.මිලියන 232.73 ක් වසර 02 සිට 05 දක්වා කාලයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගැනීමේ ශේෂය රු.මිලියන 574.13 ක් වූ අතර එයින් රු.මිලියන 275.95 ක් වූ අවුරුදු 5 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව පැවතීමට ව්‍යාපෘතිවල පැවති දෝෂ නිවැරදි නොකිරීම් (Defects Rectification) සහ ඇතැම් ව්‍යාපෘති අතරමග නැවතී තිබීම හේතු වී ඇත. | ලැබිය යුතු රඳවාගැනීම් ශේෂයන් අයකර ගැනිමට ගිවිසුම් ප්‍රකාරව නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ණයගැතියන්, කොන්ක්‍රීට් අංගන ණයගැතියන් සහ රථවාහන සංඥා පද්ධති ණයගැතියන් පිළිවෙලින් රු.මිලියන 93.79 ක්, රු.මිලියන 63.84 ක් සහ රු.මිලියන 95.77 ක් තුළ පිළිවෙලින් රු.මිලියන 10.49 ක්, රු.මිලියන 37.71 ක් හා | පොදුවේ ගත් කල එම ණයගැති ශේෂයන් සහිත ව්‍යාපෘතිවලට අදාළ සේවාදායකයින් (Client) විසින් නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම, එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් | අය විය යුතු ශේෂයන් අයකර ගැනිමට ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දී කාලීනව ණයගැති ශේෂයන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.මිලියන 6.86 ක් වර්ෂ 5 ඉක්ම වූ ණයගැතියන් විය. | කරවා නොගැනීම, පැවති දේශපාලන බල අධිකාරයන් වෙනස් වීම වැනි කරුණු කොටගෙන එම ණයගැති ශේෂයන් මේ දක්වා ලබා ගැනීමට නොහැකි වී ඇත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි සහ විවිධ ණයහිමි ශේෂය රු.මිලියන 1,130.37 ක් වූ අතර එයින් රු.මිලියන 128.46 ක් අවුරුදු 5කට වැඩි කාලයක සිටද රු.මිලියන 737.40 ක් වසර 02 සිට 05 දක්වා කාලයක් තුළ ද නිරවුල් කර නොතිබුණි. | සියළුම හිඟ බදු මුදල්, සියළු බැංකු ණය හා සියළු ණය හිමියන් පියවීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් සැලසුම් කරනු ඇත. | ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කඩිනමින් ඵලදායීව පියවරක් ගත යුතුය. |
| (ආ) | ලංකා බැංකුව, සම්පත් බැංකුව සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ලබා ගෙන තිබුණු ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 2,665.58ක හිඟ ණය වාරික සහ හිඟ පොලී වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් ගෙවීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | සභාපතිතුමා හා අධ්‍යක්ෂක මණ්ඩලය බැංකු ණය පියවීම සඳහා 25/1182/809/057-I අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ඇත. | හිඟ ණය වාරික හා පොලිය නිරවුල් කිරීමට සංස්ථාව විසින් ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | සංස්ථාව විසින් ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලෙන් රු. මිලියන 100 ක බිල්පත් වට්ටම් කිරීම් යටතේ ලබාගෙන තිබූ ණය මුදලෙන් රු. මිලියන 79.2 ක් පමණක් නැවත අරමුදල වෙත ගෙවා තිබුණ අතර ඉතිරි රු.මිලියන 20.8 ක් (පොලිය රහිත) නැවත ගෙවීම් කර නොතිබුණි. | -එම- | හිඟ ණය මුදල් නිරවුල් කිරීමට සංස්ථාව විසින් ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඈ) | සම්පත් බැංකුවෙන් රු. මිලියන 70 ක අයිරා පහසුකමක් ලබාගෙන තිබුණ අතර එම අයිරා පහසුකම ද ඉක්මවා රු. මිලියන 4.06 ක අයිරා පහසුකමක් ද ලබා ගෙන ඇති අතර අයිරා පොලිය ලෙස රු. මිලියන 9.47 ක මුදලක් සමඟ 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 83.53 ක් වී තිබුණි. | -එම- | බැංකු අයිරාව හා පොලිය ගෙවීමට ඵලදායී ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩ අත්හැර දැමූ ව්‍යාපෘති 5 කට අදාළ රු. මිලියන 16.5 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | වැඩ අවසන් ව්‍යාපෘතිවල අවසන් බිල්පත් නිකුත් කළ වහාම අවශ්‍ය ගැලපීම් සිදුකර සියළු ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. | වැඩ අත්හැර දැමූ ව්‍යාපෘතිවල අත්තිකාරම් හා ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කර ගැනීමට අදාළ |

| | | | |
|---|---|---|---|
| | | | පාර්ශවයන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවරක් ගත යුතුය. |
| (ඊ) | 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 17කට අදාළව ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 329.04 ක ශේෂයක් 2025 ජුලි 24 දිනවන විටත් නිරවුල් කර නොතිබුණු අතර විගණනයට ලබා දුන් තොරතුරු අනුව ව්‍යාපෘති 13 ක්ම වැඩ අත්හිට වූ, වැඩ නිම වූ සහ වැඩ අත්හැර දැමූ තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘති සඳහා අවසාන බිල්පත් නිකුත් කර නොමැත. අවසාන බිල්පත් නිකුත් කළ විගස සියළු ගැලපීම් කර ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |

## 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිකිරීම් අංශයේ වැඩ අත්හැර දැමූ සහ වැඩ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළ රු.මිලියන 4.61 ක මිල දී ගැනීම් අත්තිකාරම් පැවති අතර එම අත්තිකාරම් නිරවුල් වීමකින් තොරව පැවතීමට හේතු විගණනයට ඉදිරිපත් නොවීය. | අංක 1178, 1183, 1179 යන ව්‍යාපෘතිවලට අදාළ ගැණුම් ඇණවුම් මඟින් කොන්ක්‍රීට් මිලදී ගෙන ඇතත්, ඒවා නගමුපුරවර අනෙකුත් ව්‍යාපෘති සඳහා භාවිතා කර ඇත. එම නිසා ගැණුම් ඇණවුම් නිරවුල් කිරීමේ දී ඇති වූ ගැටළු සහගත තත්ත්වයක් මත මෙම ශේෂය පෙන්නුම් කරයි. අංක 1185 හා 1138 ව්‍යාපෘතිවල මුදල් අය කර ගැනීමට ඇත. | මිලදී ගැනීම් අත්තිකාරම් නියමිත කාලය තුළ පියවීම් කළ යුතු අතර කළමනාකරණය විසින් පවතින තත්ත්වය අධීක්ෂණය කර මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන විගණන පනතේ 18(6) වගන්තිය | 2024 දෙසැම්බර් 31 දිනට හිඟ විගණන ගාස්තු රු.මිලියන 14.18 ක් විගණකාධිපති වෙත ගෙවා නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදුකරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත. | ව්‍යවස්ථාපිත ගෙවීම් කඩිනමින් නිරවුල් කිරීමට කළමනාකරණය විසින් නොපමාව පියවර ගත යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති හා අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට (Procuring Entity) මෙන්ම එම රාජ්‍ය ආයතන සිදු කරනු ලබන ව්‍යාපාරික සේවා සැපයීම් (Vendor) සිදු කිරීමට | 2025 වසර තුළ රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වීම සිදු කරනු ඇත. | චක්‍රලේඛයට අනුකූලව රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වී ඒ අනුව |

| | | |
|---|---|---|
| | රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ (e–Procurement System in Sri Lanka) ලියාපදිංචි වී එම පද්ධතිය යොදා ගන්නා ලෙස දක්වා තිබුණ ද, සංස්ථාව 2025 අගෝස්තු මාසයවන විටත් රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වී නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ පනත අනුව 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ හිඟ සමාජ ආරක්ෂණ බදු මුදල් රු.මිලියන 40.35 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදුකරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත. | පනතට අනුකූලව ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 6.11 ක ජාතිය ගොඩනැගීමේ බදු සහ එම බද්ද නොගෙවීම නිසා ඒ මත පනවා ඇති දඩ මුදල රු.මිලියන 1.06 ක්ද වශයෙන්, මුළු බදු වටිනාකම වූ රු.මිලියන 7.17 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේ දී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත. | -එම- |
| (ඇ) | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත අනුව 2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංස්ථාව විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව වූ රු.මිලියන 67.50 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ඒ මත පනවා තිබුණු දඩ මුදල රු.මිලියන 33.78 ක් ද ඇතුළුව හිඟ බදු මුදල් රු.මිලියන 101.23 ක් විගණිත දින වූ 2025 සැප්තැම්බර් 30 දින දක්වා ගෙවීම් කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත. | -එම- |
| (ඈ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.මිලියන 1,700.28 ක් හා රු.මිලියන 1,267.34 ක දඩ මුදල් ද වශයෙන් එකතුව රු.මිලියන 2,967.62 ක් විගණිත දින වූ 2025 සැප්තැම්බර් 30 දින දක්වා ගෙවීම් කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේ දී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 1,411 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. මිලියන 2,246.23 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 835.23 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉදිකිරීම් ව්‍යාපෘති අංශයේ ආදායම රු. මිලියන 211.67 කින් වැඩි වීමක් විකුණුම් පිරිවැය සහ මූල්‍ය හා අනෙකුත් වියදම් පිළිවෙලින් රු.මිලියන 217 කින් හා රු.මිලියන 506.82 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | 2024<br>රු. මිලියන | 2023<br>රු. මිලියන | වෙනස<br>(වැඩි වීම /අඩු වීම)<br>රු. මිලියන | වෙනසේ ප්‍රතිශතය<br>සියයට |
|---|---|---|---|---|
| ආදායම | 430.29 | 218.62 | 211.67 | 97 |
| විකුණුම් පිරිවැය | 976.45 | 1193.51 | (217.06) | 18 |
| අනෙකුත් ආදායම් | 98.37 | 105.81 | (7.44) | 7 |
| පරිපාලන වියදම් | 153.98 | 209.43 | (55.45) | 26 |
| අනෙකුත් වියදම් | 603.93 | 935.63 | (331.70) | 35 |
| මූල්‍ය ආදායම් | 6.42 | 154.77 | (148.35) | 96 |
| මූල්‍ය වියදම | 211.73 | 386.85 | (175.12) | 45 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් (953) ක් හා (328) ක් වශයෙන් ඉහළ අලාභයක් වාර්තා වූ අතර 2023 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයේ අඩුවීමක් පැවතිය ද එය මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ අඩුවීම මත සිදු වී ඇති බවද නිරීක්ෂණය වේ. සංස්ථාවේ ජංගම අනුපාතය සහ තෝලන අනුපාතයන් ද අහිතකර තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. තෝලන අනුපාත අනුව සංස්ථාව අධිතෝලන මට්ටමේ එනම් සංස්ථාවේ වත්කම් හා හිමිකම්වලට සාපේක්ෂව අධික ණය ප්‍රමාණයක් පවතී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දී රු.මිලියන 11.29 ක වියදමක් දරා සංස්ථාව හයිඩ්‍රොලික් පොම්පය සමඟ ජැක් යන්ත්‍රයක් මිල දී ගෙන තිබුණු අතර මෙම යන්ත්‍රය වාර්තාව නිකුත් කරන දිනය දක්වා භාවිතා කිරීමට නොහැකිව අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එබැවින් යන්ත්‍රය මිල දී ගැනීමේ අරමුණ ඉටු කර ගත නොහැකිව තිබුණු අතර ඒ | ජැක් යන්ත්‍රයේ නිෂ්පාදන සමාගමවන CCL Stressing Systems LTD UK ආයතනය විසින් එහි ප්‍රධාන සැපයුම්කරුවන Showa Shoji Co. ආයතනය හරහා මෙම අක්‍රිය යන්ත්‍රය වෙනුවට නව Stressing Jack යන්ත්‍රයක් ලබා දෙන බවට ලිඛිතව SD&CC ආයතනය වෙත දැනුම් දී ඇත. | අක්‍රීය යන්ත්‍රය වෙනුවට සැපයුම් ආයතනය එකඟ වූ පරිදි නව යන්ත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සහ මූල්‍ය අවශ්‍යතා සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා දැරූ පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | | |
| (ආ) | 2022 වර්ෂයේදී සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද මැණික් කැනීම් ව්‍යාපෘතිය මගින් සංස්ථාවට රු.මිලියන 6.02 ක ශුද්ධ අලාභයක් සිදු වී තිබුණි. බලපත්‍ර හිමිකමක් නොමැතිව සංස්ථාවේ මුදල් හා ශ්‍රමය භාවිතා කරමින් සිදු කරන ලද ඵලදායී නොවන ව්‍යාපෘතියක් වූ අතර මෙම ව්‍යාපෘතිය අවසන් වී වසර 02 ක් ගත වුවද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ගෙවන ලද රු.මිලියන 0.675 ක තැන්පතු මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ද සිදුකර නොතිබුණි. | මැණික් ගල් විකිණීම සඳහා එවකට ක්‍රියාත්මක වූ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවසරය ලැබී තිබුණ ද, ඉන් පසුව ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොමැත.<br>නව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නැවත, එම අනුමැතිය යළි ලබා ගත් අතර, පළමුව මැණික් ගල් විකිණීමේ ක්‍රියාවලිය සිදු කර පසුව පතල වැසීම සිදු කිරීමට අපේක්ෂා කරයි. මැණික් වත්කම් ලෙස එම වටිනාකම වත්කම් ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා තොග පාලන අංශය වෙත යොමු කර ඇති අතර, දැනට එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතී. | මැණික් ගල් විකිණීම් සිදු කර පතල වැසීමේ කටයුතු නොපමාව අවසන් කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව විසින් වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු අතර එම වගා කටයුතුවලින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර එහි වියදම රු.මිලියන 3.32 ක් විය. තවද මෙම වගා කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය බීජ, පොහොර හෝ වෙනත් ඒ සම්බන්ධ කිසිදු වියදමක් ඉහත සඳහන් පිරිවැය තුළ ඇතුළත්ව නොමැති අතර, සේවක වැටුප් සහ අතිකාල ප්‍රධාන වශයෙන්ම ඇතුළත්ව තිබුණි. | මෙම කාලයේ දී රට තුළ පැවති අහිතකර තත්ත්වය හේතුවෙන් සේවකයන්ට පඩි ගෙවමින් කොන්ක්‍රීට් අංගන තුළ රඳවා ගැනීමට සිදු විය. එබැවින් මොවුන් ඵලදායී කටයුත්තකට යොමු කිරීමේ අදහසින් සභාපතිතුමාගේ උපදෙස් පරිදි වගා ව්‍යාපෘති ආරම්භ කරනු ලැබිණි. නිසිකලට වර්ෂාව නොලැබුණු බැවින් වගාව අසාර්ථක වී ඇත. | විධිමත් අනුමැතියක් සහිතව ඵලදායී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු අතර ඊට අනුකූල නොවූ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කොටසේ XLVIII පරිච්ඡේදයේ 29 ඡේදයට අනුකූලව කටයුතු කල යුතුයි. කාර්යක්ෂම හා ඵලදායී ව්‍යාපෘති තෝරා ගෙන ආයෝජනය කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති හයක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ව්‍යාපෘති තුනක වැඩ අත්හැර දැමූ අතර ව්‍යාපෘති හතක වැඩ අත්හිටුවා තිබුණි. එයින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති (ongoing) 2කින් රු.මිලියන 14.38 ක අලාභයක් වාර්තා කර තිබුණු අතර වැඩ අත්හිටවූ (Suspended) ව්‍යාපෘති 5කින් | 2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘතීන් බොහොමයක් අතරමග නැවතිනි. 2024 වර්ෂයවන විට ඉන් බොහොමයක් ද්විපාර්ශවික එකඟතාවය මත (Mutual terminated) ගිවිසුම් අවලංගු කර වැඩබිම් ඉවත් කරගෙන වියදම් | 2018 අංක 19 දරන විගණන පනතට අනුකූලව සිදුකරනු ලබන පද්ධති සමාලෝචනයේදී ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් අවශ්‍ය පද්ධති පාලනයන් |

| | | | |
|---|---|---|---|
| | හා වැඩ අත්හැර දැමූ (Terminated) ව්‍යාපෘති 3කින් පිළිවෙලින් රු.මිලියන 40.63ක් සහ රු.මිලියන 165ක් වශයෙන් අලාභ වාර්තා කර තිබුණි. අමතරව 2024 වර්ෂය සඳහා ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශය විසින් ව්‍යාපෘතීන් 12 කට අදාළව රු.මිලියන 81 ක අලාභයක් ද වාර්තා කර තිබුණි. | අවම කර ගැනීමට කටයුතු කර ඇත.<br>එමෙන්ම ඉතිරි අත්හිටවූ ව්‍යාපෘතිවලද වියදම් අවම කර ගැනීමට කටයුතු යොදා ඇත. | සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට සහ අලාභ අවම කර ගැනීමට සුදුසු ක්‍රමවේදයන්ද ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත අනුව 2024 දෙසැම්බර් 31 දින දක්වා සංස්ථාව විසින් නොගෙවූ සේවක අර්ථසාධක අරමුදල් මත රු.මිලියන 49.59 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | සංස්ථාව මේවන විට සියළු ගෙවීම් සිදු කර ඇත. | කාලීනව ව්‍යවස්ථාපිත ගෙවීම් කිරීම තුළින් අධිභාරයන් ගෙවීම වලක්වා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 51 කට අදාළව ප්‍රමාද වන්දි ලෙස රු. මිලියන 264.26 ක් අඩු කර ගෙන තිබුණු නමුත් ඉන් රු.මිලියන 176.35 ක් අවුරුදු 5කට වැඩි කාලයක් සිට අයකර ගෙන නොතිබුණි. වසර 02 සිට 05 දක්වා අයකර නොගත් ප්‍රමාද වන්දි ශේෂය රු. මිලියන 38.75 ක් විය. | අනවශ්‍ය ප්‍රමාදයන් නිසා කාල දීර්ඝ කිරීම් අනුමත නොවීම හේතුවෙන් එම ප්‍රමාද වන්දි ශේෂයන් ලැබිය යුතු මුදලක් ලෙස සලකා නොමැත. | ඉදිරියේදී ව්‍යාපෘති ගිවිසුම් ගත කාලය තුළ නිම කිරීම තුළින් ප්‍රමාද වන්දි ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිවිල්, යාන්ත්‍රික සහ විදුලිමය ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා තැනීම් කටයුතු ආදී සංස්ථාවේ ඉලක්කගත අරමුණු ඉටු කරගැනීම සඳහා ඉදිකිරීම්, කොන්ක්‍රීට් අයිතම නිෂ්පාදනය සහ අලෙවිය හා රථවාහන ආලෝක පද්ධතිය සහ සේවා සැපයීම යන අංශ තුන මගින් කටයුතු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව රු.මිලියන 1,205.7 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබූ අතර දළ ලාභ අනුපාතය සියයට 127 ක ඍණ අගයක් වාර්තා කර තිබුණි. ඉදිකිරීම් අංශය සහ කොන්ක්‍රීට් අයිතම නිෂ්පාදනය සහ අලෙවි අංශය මගින් ලද රු.මිලියන 452.71 ක් සහ රු.මිලියන 84.07 ක දළ අලාභයන් සංස්ථාවේ සමස්ත අලාභය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | 2023 වර්ෂයේ දී මුල්‍ය ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘතීන් බොහොමයක් අතරමග නැවතිනි. 2024 වර්ෂයවන විට ඉන් බොහොමයක් ද්විපාර්ශවික එකඟතාවය මත (Mutual terminated) ගිවිසුම් අවලංගු කර වැඩබිම් ඉවත් කරගෙන වියදම් අවම කර ගැනීමට කටයුතු කර ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් හා වියදම් වලක්වා ව්‍යාපෘති ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුව තොග ශේෂයේ වටිනාකම රු.මිලියන 513.37 ක් වූ අතර තොග සම්බන්ධ ගනුදෙනු නිවැරදිව සටහන් කිරීමට හැකිවන පරිදි ඉන්වෙන්ට්‍රි මොඩියුලයක් ගිණුම්කරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සම්පූර්ණ තොග වාර්තාවක් සහ තොග වයස් විශ්ලේෂණ වාර්තාවක් ගිණුම්කරණ පද්ධතිය තුළින් ලබා ගැනීමට නොහැකි විය. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොග වටිනාකමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය. | පරිගණක ගත ඉන්වෙන්ට්‍රි මොඩියුලයක් සංස්ථාව සතුව නොමැති වුවත් අතින් සාදන ලද විස්තරාත්මක තොග වාර්තා සංස්ථාව සතුව පවතින අතර, සම්පූර්ණ තොග වාර්තාවක් විගණනයට ඉදිරිපත් කරන ලදි. අපගේ නිගමනයට අනුව වාර්තාව, තොග වටිනාකම වූ රු.මිලියන 513.37 හි නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය පිළිබඳ තහවුරුවක් ලබා දෙනු ඇත. | තොග ලැබීම් හා නිකුත් කිරීම් නිවැරදිව සටහන් කිරීමටත් තොග වයස් විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමටත් හැකි පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 12 කට අදාළ එකතුව රු.මිලියන 0.65 ක සුළු මුදල් බැර ශේෂයක් පැවතුනි. | නොපියවූ සුළු මුදල් නිරවුල් කිරීම දැනටමත් ආරම්භ කර ඇත. ඉදිරියේදී සියලුම නිරවුල් නොවූ සුලු මුදල් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යාපෘතිය අවසානයේ සියලුම නොපියවූ සුළු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය අනුව සංස්ථාව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ රත්මලාන අංගනයට ටොන් 25 ක් එසවිය හැකි දොඹකරයක් (Crane) කුලියට ගැනීම සඳහා 2023 ජනවාරි 03 දින ආයතන 11 ක් වෙතින් මිල ගණන් කැඳවා තිබුණි. ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 07 ක් වුව ද දින 02 ක් පමණක් ලබා දී තිබුණු බැවින් ලංසු 03 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. | එහි අවශ්‍යතාවය මත දින 02 ක් තුළ මිල ගණන් කැඳවා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රමාණවත් තරඟකාරීත්වයක් ඇතිවන අයුරින් කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 වගන්තිය අනුව යම් ලංසු ඇගයීමක් අවසන් කළ පසු ප්‍රසම්පාදන අත්පොතේ සඳහන් කර ඇති ආකෘතිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙල කර, සියලුම සනාථ කිරීම් ලේඛන සහිතව එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සකස් කළ වාර්තාවක් නොමැතිව නාවල අංගනයට ටොන් 25 ක් එසවිය හැකි දොඹකරයක් (Crane) කුලියට ගැනීම වෙනුවෙන් පිරමිඩ් විල්මා ආයතනයට රු.මිලියන 3.06 ක මුදලක් ගෙවා තිබුණි. | මෙම අඩුපාඩුකම් මඟහරවාගෙන ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් කර ඇති පරිදි ප්‍රසම්පාදන කටයුතු නිසි අයුරින් කිරීමට පියවර ගනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුකූලව කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතු අතර ඊට අනුකූලව කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII හි 29 ඡේදය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩබිම්වල පවතින සේවාදායකයා වෙත බිල් නොකරන ලද තොගයෙහි (Material at Site) වටිනාකම රු.මිලියන 90.69 ක් වූ අතර වැඩ අත්හිට වූ සහ වැඩ අත්හැර දැමූ ව්‍යාපෘතිවලට අදාළව රු.මිලියන 7.30 ක සහ සම්පූර්ණ කරන ලද (Completed) ව්‍යාපෘතිවලට අදාළව රු. මිලියන 0.55 ක තොග ශේෂයන් ද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | බිල් නොකරන ලද තොගය හෙවත් Material at Site වෙනුවෙන් සේවාදායකයා හා අප ආයතනයට මුදල් ලබා දී ඇත. එම මුදල් විශේෂයෙන් වැඩ අත්හිටවූ හෝ අවසන් ව්‍යාපෘති වෙනුවෙන් සේවා දායකයාගේ අවසාන බිල්පතින් අඩු කරනු ලබයි. එසේ අඩු කිරීමෙන් පසු අවශ්‍ය සටහන් ගැලපීම් ගිණුම්වලට කරනු ඇත. | වැඩබිම්වල පවතින සේවාදායකයා වෙත බිල් නොකරන ලද තොග නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 ජනවාරි 25 දිනැති හා අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (iii) වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙවීම් කිරීමේදී ගෙවීම්වලින් සියයට 90ක් සම්පූර්ණ වීමට ප්‍රථම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගනු ලැබිය යුතු වුවත් සම්පූර්ණයෙන්ම වැඩ නිමකළ ව්‍යාපෘති 20 කට අදාළව රු.මිලියන 20.62 ක අත්තිකාරම් ද සියයට 90-100 ත් අතර වැඩ නිමකළ ව්‍යාපෘති 3කට අදාළ රු.මිලියන 23.57 ක් ද මේ දක්වා අය කරගෙන නොතිබුණි. | වැඩ අවසන් ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් ශේෂයන් නොපියවී පවතින්නෙ, තවමත් අවසන් බිල්පත් නිකුත්කර නොතිබීමයි. අවසන් බිල්පත් නිකුත් කළ වහාම අවශ්‍ය ගැලපීම් සිදුකර සියළු ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුකූලව කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතු අතර ඊට අනුකූලව කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII හි 29 ඡේදය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ඩෙව්කො ෂෝවා ආයතනයෙන් සංස්ථාවට ලැබී ඇති මෝටර් රථ 05 ක් 2025 අගෝස්තු දක්වා සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සංස්ථාව විසින් දීර්ඝ කාලීනව භාවිතා කරනු ලබන වටිනාකම රු.මිලියන 69.64 ක් වූ ඉඩම් 8 ක්ද සංස්ථාවට පවරා ගැනීමට හෝ දීර්ඝ කාලීනව බදු පදනමට ලබා ගැනීමට මේ දක්වා නොහැකි වී තිබුණි. | මෙම ඉඩම් සංස්ථාවට පවරා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ඇත. | භාවිතා කරන වත්කම්වල අයිතිය පවරා ගැනීමට හෝ බදු පදනමට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2024 දෙසැම්බර් 18 දිනැති හා අංක 05/2024 දරන චක්‍රලේඛ කළමනාකරණ චක්‍රලේඛය අනුව සියලු රාජ්‍ය ආයතනවල ආර්ථික වශයෙන් ඵලදායී නොවන හෝ භාවිතය සඳහා අවශ්‍ය නොවන වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවත් සංස්ථාවේ ධාවන කටයුතු සඳහා යොදා නොගන්නා වාහන ඒ අනුව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට සංස්ථාව සතුව පවතින වාහන සංස්ථාවේ රාජකාරි කටයුතු සඳහා යොදා ගන්නා බැවින් 2024 දෙසැම්බර් 18 දිනැති චක්‍රලේඛ කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි සඳහන් පරිදි අපහරණ ක්‍රියාවලියට සංස්ථාව සතු වාහන ඉදිරිපත් කිරීම සිදු කර නොමැත. | චක්‍රලේඛය අනුව භාවිතා නොකරන ආර්ථිකමය නොවන වාහන අපහරණය කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොත 6.6 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දින 117 ක කාලයක් ප්‍රමාදව 2025 ජුනි 25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2024 සැප්තැම්බර් 31 දිනට ස්වේච්ඡා වන්දි ක්‍රමයක් යටතේ විශාල සේවක පිරිසක් විශ්‍රාම යාම හේතුවෙන් දෛනික රාජකාරි මෙන්ම අවසාන ගිණුම් පිළියෙල කිරීම ඉතාමත් දුෂ්කර වී ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව නියමිත දිනට විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2021/01 දරන රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොත - 6.6 ඡේදය අනුව 2022 හා 2023 වර්ෂ සඳහා සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2025 ඔක්තෝබර් මාසයවන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2022 වාර්ෂික වාර්තාව කිහිපවරක් සංශෝධනයට ලක්වීම හේතුකොටගෙන ප්‍රමාද විය. නමුත් 2025 සැප්තැම්බර් 12 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලයට භාරදෙන ලදි. 2023 වාර්තාව ද ඉතා ඉක්මනින්ම පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගත යුතුය. |